**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය 2018 (2019)**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනය සඳහා අනුමත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු 8ක් පිරවීම සඳහා පැවැත්වීමට නියමිත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා ප්‍රථම වතාවට පමණක් බඳවා ගැනීම් පරිපාටියෙන් පරිබාරිහව බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ සේවයේ නියුතු පර්යේෂණ සහකාර සහ සංවර්ධන සහකාර (කෘෂි) නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර පහත සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන තරග විභාගය" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතුය. තවද, විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යෙදිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | සංකේත අංකය |
|---|---|---|---|
| 1 | විද්‍යාත්මක නිලධාරි - (තත්ත්ව සහතික) | 01 | 01 |
| 2 | විද්‍යාත්මක නිලධාරි - (වනස්පති) | 01 | 02 |
| 3 | විද්‍යාත්මක නිලධාරි - (කෘෂි) | 01 | 03 |
| 4 | විද්‍යාත්මක නිලධාරි - (ශාක අභිජණන) | 01 | 04 |
| 5 | විද්‍යාත්මක නිලධාරි - (ඖෂධ නවීකරණ) | 01 | 05 |
| 6 | විද්‍යාත්මක නිලධාරි - (ක්ෂුද්‍ර ජීව) | 01 | 06 |
| 7 | විද්‍යාත්මක නිලධාරි - (රසායන) | 02 | 07 |

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.03.05 දින වේ.

*සටහන* :

අයදුම්පත හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම දරා ගත යුතුය.

කිසියම් අයදුම්කරුවකු ඉහත සඳහන් එක් තනතුරකට වඩා අයදුම් කරන අවස්ථාවකදී එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර ඒ ඒ තනතුර සඳහා වූ මනාප අනුපිළිවෙල එකම අයදුම්පතක සටහන් කළ යුතුය. එසේම මනාප අනුපිළිවෙල පසුව වෙනස් කිරීමේ හැකියාවක් නොමැත.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙල හා මනාප අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධානවලට හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03 ක් ඇතුළත එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

IV. තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

V. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලටද, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද, මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615 -10 x 1335 - 8 x 1630 - 17 x 2170 - රු.110,895.00 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

04. අධ්‍යාපන සුදුසුකම් ඃ

| *අනුමත තනතුර නාමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| විද්‍යාත්මක නිලධාරි (තත්ත්ව සහතික) | රාසයන විද්‍යාව විෂය සහිත පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධිය<br>හෝ<br>රාසයන විද්‍යාව විෂය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම<br>හෝ<br>රසායන විද්‍යාව විෂය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| විද්‍යාත්මක නිලධාරි (වනස්පති) | පිළිගත් විශ්වවිද්‍යාලයක උද්භිද විද්‍යාව විශේෂ උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම (රසායන විද්‍යාව අතිරේක විෂයය ලෙස)<br>හෝ<br>උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව සහිතව ජීව විද්‍යා උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමත් වීම<br>හෝ<br>උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව සහිතව ජීව විද්‍යා උපාධිය හා ඖෂධ ශාක සම්බන්ධව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| විද්‍යාත්මක නිලධාරි (කෘෂි) | කෘෂි විද්‍යා උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා තිබීම<br>හෝ<br>උද්භිද විද්‍යාව හෝ වන විද්‍යාව පන්ති සාමර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම<br>හෝ<br>උද්භිද විද්‍යාව හෝ වන විද්‍යාව විෂයය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| විද්‍යාත්මක නිලධාරි - (ශාක අභිජනන) | කෘෂි විද්‍යා උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව සමත් වීම<br>හෝ<br>උද්භිද විද්‍යාව හෝ වන විද්‍යාව විෂයය සහිත පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම<br>හෝ<br>උද්භිද විද්‍යාව හෝ වන විද්‍යාව විෂයය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| විද්‍යාත්මක නිලධාරි - (ඖෂධ නවීකරණ) | පිළිගත් විශ්වවිද්‍යාලයක උද්භිද විද්‍යාව විද්‍යාවේදී විශේෂ උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම (රසායන විද්‍යාව අතිරේක විෂයය ලෙස)<br>හෝ<br>උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව සහිතව ජීව විද්‍යා උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම<br>හෝ<br>උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යා උපාධිය හා ඖෂධ ශාක සම්බන්ධව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| විද්‍යාත්මක නිලධාරි - (ක්ෂුද්‍ර ජීව) | ක්ෂුද්‍ර ජීව විද්‍යාව විශේෂ උපාධිය හෝ උද්භිද විද්‍යා විශේෂ උපාධිය ක්ෂද්‍ර ජීව විද්‍යාව විෂයය සහිතව පන්ති සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම<br>හෝ<br>ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ජෛව රසායන විද්‍යාව විෂයය සහිතව පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග ජෛව රසායන විද්‍යාව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| විද්‍යාත්මක නිලධාරි - (රසායන) | රසායන විද්‍යාව විශේෂ උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව සමත් වීම<br>හෝ<br>රසායන විද්‍යාව විෂයය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පන්ති සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම<br>හෝ<br>රසායන විද්‍යාව විෂයය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම |

5. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි මැනවින් ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6. *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයෙක් නොවිය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. 7.1 *ලිඛිත විභාගය :*

7.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40 |

7.1.2 *විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ සාමාන්‍ය දැනුම මැනෙන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්නවලින් සමන්විතය. ලකුණු 25 කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න 8කින් 05කට පිළිතුරු සැපයිය යුතුය. ලකුණු 75 කි. |

7.2 *විභාග ප්‍රතිඵල :*

ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත් ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල දැන්වීම තැපැල් මගින් හෝ www.result.exams.gov.lk වෙබ් අඩවි මගින් සිදු කරනු ඇත.

8 *විභාග කොන්දේසි :*

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

II. විභාග ගාස්තුව රු. 600.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනාරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට/ උප තැපැල් කාර්යාලයකට දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපත එහි දාරයකින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ. විභාග ගාස්තු වශයෙන් මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

IV. අයදුම්පත්‍රය සෙ.මී.22-29 ප්‍රමාණයේ (A4) කඩදාසිවල සකස් කළ යුතු අතර, 01-3.11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවෙහි අඩංගු වන ලෙස සකස් කළ යුතු අතර අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට්* නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

*සටහන :* ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම්පත්‍රය රාජ්‍ය පරිපාලන හා ආපද කළමනාකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් (www.pubad.gov.lk) බාගත හැක.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* - අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

V. අයදුම් පත්‍ර ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත්, තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. ඔබ තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්ද, ලියාපදිංචි කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීමක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් එලදායී වනු ඇත.

*සටහන :* ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

VII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

VIII. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර තිබිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය;
- වලංගු රියදුරු බලපත්‍රය.

*සැලකිය යුතුය :* අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.
ආ. ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

9. සියලුම අපේක්ෂකයින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 17 වැනි දින.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය දේශීය වෛද්‍ය අංශය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ*
*බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ*
*ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය 2018 (2019)*

**Competitive Examination For Recruitment To the Posts in Grade III of Sri Lanka Scientific Service at the Bandaranayake Memorial Research Institute of Department of Ayurveda, Indigenous Medicine Division, Ministry of Health Nutrition and Indigenous Medicine - 2018 (2019)**

01. විභාගයට පෙනී සිටින මාධ්‍ය :

| | |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි)

02. අයදුම්කරන තනතුර/ තනතුරු :

| *මනාප අංකය* | *තනතුරු නාමය* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

03. පුද්ගලික තොරතුරු :

3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.
(*උදා* :- HERATH MUDIYANSLAGE SAMAN KUMARA GUNAWARDHANA)

3.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :- Mr./ Mrs./ Miss :————.
(*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන් ) :————.

3.4 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
(මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)

3.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

3.6 තැපැල් නගරය :————.

3.7 ජාතික හැඳුනුම්පත් අංකය :-

3.8 ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.9 දුරකථන අංකය :
ජංගම :

ස්ථාවර :

3.10 උපන් දිනය ඃ

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.11 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

3.12 ජන වර්ගය ඃ
සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5 ☐

3.13 විවාහක/ අවිවාහක බව ඃ විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.14 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

04. සුදුසුකම් ඃ

4.1 උපාධිය ලද දිනය :————.
(මෙම සුදුසුකම ඇද්දැයි බැලීමට නිවේදනයේ (4) කරුණාකර හොඳින් කියවන්න)

| විභාගය/ උපාධිය | පන්තිය | වර්ෂය | විෂයයන් | විශ්ව විද්‍යාලය/ ආයතනය |
|---|---|---|---|---|
| | | | | |

05. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ,

5.1 දැනට දරන තනතුර :————.
5.2 ශ්‍රේණිය :————.
5.3 පත්වීම් දිනය :————.
5.4 පත්වීම් ස්ථිර කළ දිනය :————.

06. මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

| ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |
|---|

කුවිතාන්සි අංකය :————.
ගෙවන ලද තැපැල් කාර්යාලය :————.
දිනය :————.

07. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න.

08. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හා වැරදි සහගත බව පත්වීම් ලබා දීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුරට නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව පත් කිරීම අවලංගු කළ හැකි බවත්, සියලු නීති රීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

09. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව* :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරන ———— මයා/මිය/මෙය ———— වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ ඇය භාජනය නොවූ බව ද, මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රයෙන් සොයාගෙන ඇති බව ද, අදාළ *ගැසට්* නිවේදනයන් හි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බව ද, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද, සහතික කරමි.

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————,

නම :————,

තනතුර :————,

ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

02-126